අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்லை, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 · +94112784846
isurupaya@moe.gov.lk · www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/01/27/15/01-2021 · ඔබේ යොමුව / உமது இல. / Your Ref. · දිනය / திகதி / Date 2021.03.01

විශේෂ අවධානයට

සියලුම ජාතික පාසල් විදුහල්පතිවරුන් වෙත.

ජාතික පාසල් ගුරු ස්ථාන මාරු සම්බන්ධයෙන් කටයුතු කිරීම

වර්ෂ 2020 ට අදාල වාර්ෂික ගුරු ස්ථාන මාරු කටයුතු මේ දිනවල අවසන් වෙමින් පවතින අතර, 2022 වර්ෂයට අදාළව වාර්ෂික ගුරු ස්ථාන මාරුවීම් සඳහා අයදුම්පත් කැඳවීමට අවශ්‍ය ව ඇත. ඒ අනුව ඊට අදාළව සියලු ජාතික පාසල් හි ගුරු ඌනතා / අතිරික්තතා විෂයානුබද්ධව ගණනය කිරීම කඩිනමින් කළ යුතුව ඇත.

02. එබැවින් නැවත ඔබ වෙත දැනුම් දෙන තෙක් 2021.03.01 දින සිට ජාතික පාසල් අතර හෝ ජාතික හා පළාත් සභා පාසල් අතර සිදුකරන පහත පරිදි වන ස්ථාන මාරුවීම් තාවකාලිකව අත්හිටුවීමට තීරණය කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

- වාර්ෂික ගුරු ස්ථාන මාරු
- සුහද මාරු
- පළාත් රාජ්‍ය සේවයෙන් ජාතික පාසල් සේවයට සිදු කරන ගුරු ස්ථාන මාරුවීම්

03. ඒ අනුව නැවත 2022 වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් කැඳවන තෙක් ස්ථාන මාරු සම්බන්ධ ඉල්ලීම් ඉදිරිපත් නොකරන ලෙසට සියලු ගුරු භවතුන් දැනුවත් කරන ලෙසත්, එවැනි අයදුම්පත් නිර්දේශ කර එවීමෙන් වලකින ලෙසත් වැඩිදුරටත් දන්වා සිටිමි.

04. මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

පී.කේ.එස්.ප්‍රභෝදිනී
අතිරේක ලේකම් (ආයතන)
අධ්‍යාපන ලේකම් වෙනුවට

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister · +94112784832 · +94112784825 · minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary · +94112784811 · +94112785162 · secretary.education@moe.gov.lk